සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade } 11 ශ්‍රේණිය	ක්‍රිස්තියානි ධර්මය - I	කාලය / நேரம் / Time } පැය 03 යි.

නම / பெயர் / Name } ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. } .....

උපදෙස්:

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- **අංක 01 සිට 40 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරු අතුරෙන් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ගන්න.**
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි කව අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.**

---

1. ඊශ්‍රායෙල් ඉතිහාසය ආරම්භ වන්නේ,
   (1) ලෝකය මැවීමේ සිද්ධියෙන් ය.
   (2) මහා ජල ගැල්මෙන් පසුව ය.
   (3) ආදි පීතෘ ආබ්‍රහම් තුමාගෙන් ය.
   (4) මිසරයේ වහල්කමින් ජනතාව නිදහස් කළ පසුව ය.

2. ඊශ්‍රායෙල් ජනතාව සාරධර්මවලින් යුතු විනය ගරුක සමාජයක් බවට පත්කිරීම සඳහා,
   (1) දිවැසිවරුන් විවිධ කාලවල දී ජනතාවට මග පෙන්වූවෝ ය.
   (2) සීනයි කන්දේදී දස පනත ලබා දුන් සේක.
   (3) ආදි පීතෘ යුගය ආරම්භ විය.
   (4) ගෝත්‍ර දොළහක් නිර්මාණය විය.

3. "මෙසියා" යන්නෙහි අර්ථය,
   (1) දෙවියන් වහන්සේ අප සමග ය.
   (2) විනිශ්චයකාරයාණෝ ය.
   (3) ආලේප කරනු ලැබූ තැනැත්තාණෝ ය.
   (4) පුරාණ ගිවිසුමේ අවසාන දූතයා ය.

4. සාම රාජ්‍යයේ සාමකාමී හා සංහිඳියාවෙන් පිරුණු දිවි පෙවෙතක් ගැන අලංකාරව විස්තර කරන්නේ,
   (1) ජෙරමියා දිවැසිවරයා
   (2) යෙසායා දිවැසිවරයා
   (3) එසකියෙල් දිවැසිවරයා
   (4) ආමොස් දිවැසිවරයා

5. පැරණි ගිවිසුමේ තම එඬේරාණෝ ලෙස ඔවුන් පිළිගත්තේ,
   (1) ජේසුස් වහන්සේ (2) ආබ්‍රහම් (3) දාවිත් (4) දෙවියන් වහන්සේ

6. දුක් විඳින සේවකයා තුළ දකින්නට ලැබෙන චරිත ලක්ෂණ,
   (1) පව්කරුවන්ගේ පව් දරා ගනිමින් මැදහත්කාරකම් කරයි.
   (2) සැර පරුෂ ගති ලක්ෂණ දක්වයි.
   (3) සිත් ඇදගන්නා රූපයක් ඇත.
   (4) දුක් පීඩාවන්ට ලක් වූ අය දකින්නට ලැබේ.

7. ප්‍රේමය පිළිබඳව ඇති උතුම් ආදර්ශය නම්,
   (1) සතුරාට සමාව දීම ය.
   (2) මිතුරන් වෙනුවෙන් සිය දිවි පිදීම ය.
   (3) තමා සතු සියලු දේ අන්‍යයන්ට දීම ය.
   (4) අසල්වාසීන්ගේ සියලු අවශ්‍යතා ඉටු කිරීම ය.

Past Papers Wiki

8. දෙවියන් වහන්සේගේ පුත්‍රයෝ බවට පත් වන්නේ,
(1) යුක්තිය උදෙසා පීඩා විඳින්නන් ය. (2) ධර්මිෂ්ඨකමට සාපිපාසා වන්නෝ ය.
(3) සිතින් පවිත්‍රව සිටින්නෝ ය. (4) සාමය ඇති කරන්නන් ය.

9. "පල්ලියේ ගොඩනැගිල්ල ජනතාව සඳහා ය" මෙසේ ප්‍රකාශ කළේ,
(1) මයිකල් රුදිගු පියතුමා (2) ලක්ෂ්මන් වික්‍රමසිංහ රදගුරුතුමා
(3) චන්ද්‍රා ප්‍රනාන්දු පියතුමා (4) අබා කොස්තා පියතුමා

10. ගරු තිස්ස බාලසූරිය පියතුමාගේ විශේෂ ප්‍රකාශයක් වන්නේ,
(1) කිසිවෙක් තමාට ස්වාමියාණේ කියා නොගන්න.
(2) වෛරය හා මිත්‍යාවබෝධය පැරදි විය හැක්කේ ප්‍රේමයෙන් හා සමාව දීමෙන් පමණකි.
(3) ඔබ කළ වරදට මම සමාව දෙමි.
(4) සාතනය මම හෙළා දකිමි.

11. ..... තොරව පව් කමාව නොලැබේ. මෙහි හිස්තැනට යෝග්‍ය පිළිතුර,
(1) දුක් මනස්ථාපනයෙන් (2) වන්දි ගෙවීමෙන්
(3) වරද පිළිගැනීමෙන් (4) යාච්ඤා කිරීමෙන්

12. ක්‍රිස්තුස් වහන්සේ පෙන්වා දෙන ඒකත්වයේ ප්‍රධාන අදහස විය යුත්තේ..... වඩාත් නිවැරදි පිළිතුර,
(1) තම තමන්ගේ සභා කටයුතු වෙන්ව පවත්වාගෙන යාමයි.
(2) කිතුනු සභා නිකායන් තම නායකයන් තෝරා පත් කරගත යුතුය.
(3) සියලු සභා ක්‍රිස්තුස් වහන්සේ අදහමින් ඒකත්වයට සාක්ෂි දරන කිතුණු අනුගාමිකයන් වීමයි.
(4) කිතුණු සාක්ෂි දුර්වල කරගත නොයුතුය.

13. පෞද්ගලික බලාපොරොත්තු ඉවත දමා දෙවියන් වහන්සේ ඔවුන්ට ඇතිකළ බලාපොරොත්තු කෙරෙහි රැඳෙමින් ක්‍රියා කළ පැරණි ගිවිසුමේ ප්‍රධාන පෙළේ නායකයන් දෙදෙනා,
(1) ආබ්‍රහම් හා දාවිත් (2) ආබ්‍රහම් හා මෝසෙස්
(3) මෝසෙස් හා ජොෂුවා (4) ජාකොබ් හා ඊසාක්

14. පෙන්තකොස්ත දිනයේ දී ශුද්ධාත්මයාණන් වැඩම කළේ,
(1) පරවියෙකුගේ විලාශයෙන් (2) වළාකුලක ආකාරයෙන්
(3) දේවදූතයෙකුගේ විලාශයෙන් (4) ගිනි දිවි ආකාරයෙන්

15. මුල් කිතුනු සභාවේ ගැටලුවලට මුහුණ දීමේ දී එම අභියෝග ජය ගැනීමට දැක්වූ ක්‍රියාදාමයකි,
(1) කාලය විසින් එම ගැටලු විසඳාවි යන්න මතයක් දැරීම.
(2) ගැටලු ඇතිවීමේ දී ක්ෂණිකවම විසඳුම් සොයා ගැනීම.
(3) විවිධ හැකියාවන් යොදාගෙන ඒ පිළිබඳව අදහස් ඉදිරිපත් කිරීම.
(4) ගැටලු නිරාකරණය කරගත හැකි පුද්ගලයන් සොයා දැනුවත් කිරීම.

16. ප්‍රථම වතාවට විජාතීන් ශුද්ධාත්ම බලය අත්දුටු අවස්ථාවක් වන්නේ,
(1) ශතාධිපති කොරණේලියස් ඇතුළු පිරිස
(2) ඉතියෝපියාවේ කන්දකි බිසවගේ භාණ්ඩාගාරිකවරයා
(3) කයිසාරිය නුවර සිටි විජාතිකයන් පිරිස
(4) තම පුත්‍රයා සුවපත් කරගත් රෝම නිලධාරීතුමා

17. විජාතීන්ගේ අපෝස්තුළුවරයා වන පාවුල් අයත් ගෝත්‍රය වන්නේ,
(1) දාන් (2) ඒප්‍රායිම් (3) බෙන්ජමින් (4) ලෙවි

18. දමස්කයේදි පාවුල් කිතුනු සහෝදරත්වයට පිළිගැන්වූයේ,
(1) ලිඳියා නමැති කාන්තාවකි. (2) අපොල්ලස් නැමැති තැනැත්තා
(3) අනනියස් නැමැත්තා (4) බර්ණබස් නැමැති කිතුනුවා

19. ජීවිතයේ මූලික අභිප්‍රාය සතුට හා සොම්නස සෙවීම බව විශ්වාස කළ කණ්ඩායම වූයේ,

(1) එපිකූර්ය දාර්ශනිකයන්
(2) ස්තෝයික දාර්ශනිකයන්
(3) එසේනිවරුන්
(4) සෙලෙට්වරුන්

20. ස්ථානෝචිත ප්‍රඥාවෙන් පාවුල් තුමා ක්‍රියා කළේ,

(1) ගාසාවේ දී
(2) පිලිප්පියේ දී
(3) ඇතැන්ස් හිදී
(4) අන්තියෝකියේ දී

21. පාවුල් තුමා සිරකරුවකු ලෙස රෝමය බලා ගමන් කරද්දී ඔහු සමග එකතු වූ දෙදෙනා,

(1) ලූක් සහ තිමෝති
(2) සීලස් සහ බර්ණබස්
(3) ලූක් සහ ආරිස්තාර්කස්
(4) එරස්තස් හා තිමෝති

22. ජේසුස් වහන්සේ විසින් සමාරිය ස්ත්‍රියට දුන් වැදගත්ම පණිවිඩයකි.

(1) විවිධ ආකල්ප තුළ සේවය කිරීමෙන් ජීවන ජලය ලබාගත හැකි බවයි.
(2) සදාතනික ජීවන ජලය උන්වහන්සේ තුළින් ලැබෙන බවයි.
(3) එක සමාන අරමුණු එක්සිත්ව ක්‍රියාවේ යෙදවීමයි.
(4) සංවාද තුළින් ජීවිත අභියෝග ජයගත හැකි බවයි.

23. සදාචාරාත්මක සමාජයක් ගොඩනැගීම ආරම්භ වන්නේ,

(1) පවුල නමැති ඒකකයෙන්
(2) දේවස්ථානයෙන්
(3) පාසලෙන්
(4) නීතිය ක්‍රියාත්මක කරන ආයතන තුළින්

24. දේව රාජ්‍ය උරුම කර ගැනීමට නම් කළ යුතුම දේ,

(1) ඉරු දින දේව මෙහෙයට සහභාගි වීම.
(2) යාච්ඤාවේ ජීවිතය ගත කිරීම.
(3) දේව කැමැත්ත මුළුමනින් ම ඉටු කිරීම.
(4) තමන් සතු දේ අන් අය සමග බෙදා ගැනීම.

25. අන් අය ගැන සංවේදී විය යුතු බව පැහැදිලි කරන උපමා දෙකක් නම්,

(1) තලෙන්ත උපමාව හා අකීකරු පුත්‍රයා උපමාව
(2) යහපත් සමාරිතයා උපමාව හා ධනවතා හා ලාසරස් උපමාව
(3) අඹ ඇටයේ උපමාව හා එල නොදැරූව අත්තික්කා ගස උපමාව
(4) නැති වූ කාසිය පිළිබඳ උපමාව හා තිරිඟු හා කිරිදි උපමාව

26. "මා ඔබට ප්‍රේම කලාක් මෙන් ඔබද එකිනෙකාට ප්‍රේම කරන්න" මේ ප්‍රකාශයෙන් අදහස් කරන්නේ,

(1) අපට යහපත කරන අයට පමණක් ප්‍රේම කළ යුතු බවය.
(2) තරාතිරම් නොබලා සියල්ලන්ට ම ප්‍රේම කළ යුතු බවය.
(3) සතුරන්ට පවා අප ප්‍රේම කළ යුතු බවයි.
(4) අපගේ අසල්වාසීන්ට විශේෂයෙන් ම අප ප්‍රේම කළ යුතු බවය.

27. ජාකොබ්ගේ පරපුර මිසරයේ වහල් සේවයෙන් මුදා ගැනීමේ සිද්ධිය සඳහන් වන්නේ,

(1) නික්මයාම පොතේ ය.
(2) ද්විතිය නීති පොතේ ය.
(3) උත්පත්ති පොතේ ය.
(4) ගනන් කතාවේ ය.

28. ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රධාන ඉගැන්වීමක් වන සැබෑ සහෝදරයන් ලෙස උන්වහන්සේ සලකන්නේ,

(1) ලේ නෑයන් වන අය
(2) බව්තිස්මය ලැබූ අය
(3) දේව කැමැත්ත ඉටුකරන අය
(4) ශුද්ධ බයිබලය ගැන හොඳින් ඉගෙන ගත් අය

29. "ධනවතෙකුට දේව රාජ්‍යයට ඇතුල් වීමට වඩා ඔටුවකට ඉඳිකටු මලින් රිංගා යාම පහසු ය." මේ ප්‍රකාශයෙන් අදහස් වන්නේ,

(1) ඉඳිකටු මල ඔටුවකුට වඩා කුඩා බවය.
(2) දේව රාජ්‍යයට ඔටුවකු පිට යා නොහැකි බවය.
(3) දේවරාජ්‍යයට ඇතුළු විය හැක්කේ දිළිඳුන්ට පමණක් බවය.
(4) ධනවතකුට දේව රාජ්‍යයට ඇතුළුවීම දුෂ්කර බවය.

30. ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතයේ වැදගත්ම සිදුවීම් වන්නේ,
(1) ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රසිද්ධ ජීවිතය, මරණය, උත්ථානය
(2) ක්‍රිස්තුස් වහන්සේගේ උත්පත්තිය, මරණය, උත්ථානය
(3) ක්‍රිස්තුස් වහන්සේගේ දුක් විඳීම, මරණය හා උත්ථානය
(4) ක්‍රිස්තුස් වහන්සේගේ දුක් විඳීම, මරණය හා ස්වර්ගාරෝහණය

31. "ගැලවීම ලබන පිණිස මා කුමක් කළ යුතුද?" පාවුළුතුමාගෙන් මෙසේ ඇසූ තැනැත්තාට ඔහුගේ පිළිතුර වූයේ,
(1) ඔබේ පවිකාර ජීවිතයෙන් ඈත්වන්න.
(2) ස්වාමීන් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ අදහන්න.
(3) පූජකයන් ඉදිරියේ පෙනී සිටින්න.
(4) නොපසුබට වීර්යයෙන් ගැලවීම සොයා යන්න.

32. පාවුලු තුමා කුඩා කල සිට දැන සිටි හස්ත කර්මාන්තය වූයේ,
(1) කූඩාරම් කර්මාන්තය
(2) ඉටි පහන් සැකසීම.
(3) වේවැල් කූඩ සෑදීම.
(4) ගෘහ නිර්මාණ ශිල්පය

33. අන්තියෝකීය සභාවේ පාවුල්හට දිවැස් ප්‍රකාශ ගෙන එනු ලැබූ දිවැසිවරයා,
(1) ආමොස් (2) හොසියා (3) අගබස් (4) ජෙරමීයා

34. දෙවියන් වහන්සේගේ සුවිශුද්ධත්වය ඉදිරියේ තම පාපයේ බරපතල බව වටහා ගනු ලැබූ රජතුමකු වන්නේ,
(1) සාවුල් (2) සළමොන් (3) ශෙදකියා (4) දාවිත් රජ

35. ක්‍රිස්තුස් වහන්සේ නැවත වඩින්නේ,
(1) ගැලවීමේ කාර්යය සම්පූර්ණ කිරීමට
(2) ශ්‍රාවක පොරොන්දු ඉටු කිරීමට
(3) මුළු මැවිල්ල වෙනස් කිරීමට
(4) සභාව නවතාවයකට පත් කිරීමට.

36. දේව සේවයේ අසිරුතාවය තුළින් පාවුල් තුමා වටහා ගත්තේ,
(1) දේව සේවය ඉතා බැරෑරුම් බවයි.
(2) හැකි තරම් ගැටලුවලින් දුරස්ව කටයුතු කිරීම යහපත් බවයි.
(3) දේව සේවය වෙනුවෙන් පූර්ණ කාලීනව සිටීමින් පැමිණෙන සෑම අභියෝගයක් ම විශ්වාසයෙන් ජයගත යුතු බවයි.
(4) දේව සේවයේ අභියෝග පරාජය කිරීමට ඉතා අපහසු හා වේදනාකාරී බවයි.

37. සිරකරුවෙකු සේ අවසාන වරට පාවුලු තුමා ගෙන යනු ලැබුවේ,
(1) පිලිප්පි නුවරට
(2) කායිසාරියේ නුවරට
(3) රෝම නුවරට
(4) කොරින්ති නුවරට

38. විවිධ ජන කොටස් අතර ජීවත්වන කිතුණුවා
(1) තම සැබෑ විශ්වාසය කඩ නොවන ලෙස ඔවුන් සමඟ සහයෝගයෙන් කටයුතු කළ හැකි වේ.
(2) ඔවුන් සමඟ සීමිත සබඳතා පවත්වාගත යුතුය.
(3) සමඟද්ධිමත් ජීවිත ගත කරනු පිණිස කටයුතු කළ යුතුය.
(4) ශ්‍රී ලාංකික සමාජ වටිනාකම් ප්‍රශංසාවට ලක් කළ යුතුය.

39. තමා ගැන අධි තක්සේරුවකින් ක්‍රියා නොකළ යුතු යැයි අපට උගන්වන උපමා කතාව වන්නේ,
(1) නාස්තිකාර පුත්‍රයා
(2) පරිසියා හා අයකැමියා
(3) මහා මංගල භෝජනය
(4) මිදිවත්ත හා ගොවීන්

40. අර්බුද ඇතිවීම කිතුනු අපට ද ප්‍රායෝගික වේ. එහිදී අප විසින් කළ යුතු වන්නේ,
(1) අර්බුද හමුවේ පලායාමයි.
(2) ජීවිත අර්බුද විසඳා ගැනීමට අන් අයගේ පිහිට පැතීමයි.
(3) පෙර අත්දැකීම් සසඳා බලා තීරණ ගැනීමයි.
(4) ඇදහිල්ලෙන් ස්ථිරව සිට සාක්ෂි දැරීම.

Past Papers Wiki

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade	11 ශ්‍රේණිය	**ක්‍රිස්තියානි ධර්මය - II**	කාලය / நேரம் / Time

නම / பெயர் / Name ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

සැලකිය යුතුයි:

- **පළමුවැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව සම්පූර්ණ ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, තෝරාගත් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමිවේ.**

---

1) කෙටි පිළිතුරු සපයන්න.
   i. ජුදෙව් ජන සමාජයට ද අපට ද දස පනත දීම තුළින් දෙවියන් වහන්සේ අපගෙන් බලාපොරොත්තු වන කරුණු දෙකක් ලියන්න.
   ii. යෙසායා ඉදිරිපත් කරන සාම රාජ්‍යයේ සංකල්ප දෙකක් ලියන්න.
   iii. බැටළුවන් සේ අප ක්‍රියා කළ යුතු ආකාර දෙකක් ලියන්න.
   iv. පැරණි ගිවිසුමේ තම අවල ඇදහිල්ල නිසා දුක් වින්ද පෙළපොතේ සඳහන් චරිත දෙකට අයත් වන අය කවුරුන්ද?
   v. සඳහටම පවතින ශ්‍රේෂ්ඨතම ධර්මතාවය කුමක්ද? එහි ලක්ෂණ දෙකක් ද ලියන්න.
   vi. වර්තමානයේ සභා එකමුතුව සඳහා කටයුතු කරන ආයතන දෙකක් සඳහන් කරන්න.
   vii. මුල් කිතුනු සභාවේ වැදගත්ම කාර්ය භාර දෙකක් ලියන්න.
   viii. පේදුරුතුමාට ශුද්ධාත්මයාණන් ලැබුණු පසුව මුහුණ දෙන්නට සිදු වූ අභියෝග දෙකක් ලියන්න.
   ix. සිත් හැරීමෙන් පසුව පාවුල්තුමා කළ සේවාවන් දෙකක් ලියන්න.
   x. ගලාති පොතේ සඳහන් කරන ආකාරයට මාංශික තෘෂ්ණා දෙකක් ලියන්න.

2) i. දරිද්‍රතාවය ඇතිවීමට බලපාන හේතු දෙකක් ලියන්න.
   ii. දරිද්‍රතාවය නැති කිරීමට ඔබ කරන යෝජනා තුනක් ලියන්න.
   iii. මෙලොව භෞතික වස්තු නොව අධ්‍යාත්මික වස්තු කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා ජේසුතුමා ඉගැන්වූ උපමා කතා දෙකෙන් එකක් විස්තර සහිතව ලියන්න.

3) i. මිනිසා විසින් නිර්මාණය කරන ව්‍යාසන තත්ව දෙකක් ලියා එසේ ඇති කිරීමට මිනිසා පෙළඹෙන කරුණු දෙකක් ද ලියන්න.
   ii. අතීතයේදී ඊශ්‍රායල් ජනතාව මුහුණදුන් වහල් තත්වය හා ඉන් මිදුණු ආකාරය කෙටියෙන් ලියන්න.
   iii. අද අප ජීවත්වන සමාජය තුළද නොයෙක් ආකාර වහල්කම්වලට ඇද දමන බලවේග තුනක් ලියා ඒවායින් මිදීමට ක්‍රියා කළ යුතු ආකාර දෙකක් ලියන්න.

PAST PAPERS WIKI

4) i. අමෝස් දිවැසිවරයා හඳුන්වන්න.

ii. අමෝස්ගේ පණිවිඩය තුළ ඔහු සමාජයට දෙන මග පෙන්වීම පැහැදිලි කරන්න.

iii. අද සමාජයේ ද අයුක්ති සහගත ක්‍රියා හඳුන්වා ඒවාට විරුද්ධව ගෙන ඇති ක්‍රියාමාර්ග ද ලියන්න.

5) i. යෙසායාගේ කැඳවීම ගැන කෙටි විස්තරයක් ලියන්න.

ii. දේව හඬට අකීකරු වුවහොත් මිනිසාට ඉන් ලැබෙන ප්‍රතිඵල තුනක් ලියන්න.

iii. පිවිතුරු බවට එරෙහිව සමාජයෙන් ඔබට යම් පරීක්ෂාවක් ඔබේ නවයොවුන් වියේදී ලැබුණහොත් ඔබ ඉන් ගැලවීම සඳහා කරන කාර්යයන් පහක් ලියන්න.

6) i. පාවුල්තුමාව දෙවියන් වහන්සේ විසින් සූදානම් කළ ආකාරය ඔහුගේ පළමු ජීවිත පැවැත්ම තුළින් ලියන්න.

ii. ඔහුගේ පුදුමාකාර හැරීම ගැන පැහැදිලි කරන්න.

iii. පාවුළුතුමාගෙන් අපට ලැබෙන ආදර්ශ පහක් ලියන්න.

7) පහත සඳහන් මාතෘකා දෙකක් තෝරාගෙන, කරුණු පහ බැගින් ලියන්න.

i. මුල් කිතුණු සභාව

ii. ජෙරුසලම් මන්ත්‍රණ සභාව

iii. කිතුනු ප්‍රතිපත්ති

iv. යහපත් බැටළු එඬේරා

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank